www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සුනාමියෙන් විනාශ වූ ශ්‍රී ලංකාවේ පාසැල් තවමත් පිළිසකර කර නැත

## Sri Lankan schools still not rebuilt after tsunami

**එම්. අරවින්දන් හා සරත් කුමාර විසිනි**
**2005 අගෝස්තු 10**

ශ්‍රී ලංකාවේ ආර්ථික වසයෙන් වඩාත් අවාසිදායක ප්‍රදේශයන් ගෙන් එකක් වත් අම්පාර දිස්ත්‍රික්කයේ තරුනයන්ගේ, ප්‍රධාන ගැලවීම් මාර්ගය වී තිබෙන්නේ අධ්‍යාපනය යි. දෙසැම්බර් 26 සුනාමියෙන් පාසැල්වලට සිදු වූ හානිය සාමාන්‍ය ජනතාවට, විශේෂයෙන් නැගෙනහිර මුහුදු තීරයේ ජීවත්වන ශිෂ්‍යයන්ට විශාල පහරක් විය.

ආන්ඩුවේ ගනන්හිලව්වලට අනුව දිස්ත්‍රික්කයේ පාසල් 40ක් රල පහරින් හානියට පත් විය. එයින් පාසල් 28ක් ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ ආන්ඩුව විසින් කුමන ආකාරයක හෝ ඉදිකිරීම් තහනම් කරන ලද මීටර් 200 යේ සීමාව තුල පිහිටි බැවින්, වෙනත් ස්ථානයක ඉදි කල යුතුව ඇත.

කලාපය තුල විනාශයට පත් පාසැල්වලින් 23ක් ම පිහිටි අක්කරයිපත්තු අධ්‍යාපන කොට්ඨාශය තුල නැවත ඉදිකිරීම් ආරම්භ වී ඇත්තේ එක් පාසලක පමනි. කල්මුනේ අධ්‍යාපන කොට්ඨාශය තුල හානියට පත් පාසල් 17න් 15ක්ම සම්පූර්නයෙන් ම විනාශ වූ අතර පාසල් 8ක් වෙනත් ස්ථානවල අලුතින් ඉදිකල යුතු ය. එම කොට්ඨාශය තුල ද ප්‍රතිසංස්කරනය ආරම්භ වී ඇත්තේ එකම පාසලක පමනි.

ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කන්ඩායමක් විනාශ වීමෙන් පසුව තාවකාලිකව පවත්වාගෙන යන පාසල් ගනනාවකට ම ගොස් කරුනු සොයා බැලූහ. දැඩි ලෙස සුනාමියට ගොදුරු වූ මරුදමුනේහි 1978 දී ආරම්භ කරන ලද ජේම්ස් මධ්‍ය මහා විද්‍යාලය සිසුන් 1542න් 104 ක් මරනයට පත් වූ අතර දැන් පැමිනෙන්නේ සිසුන් 1300 දෙනෙක් පමනි.

පාසලේ නියෝජ්‍ය විදුහල්පති පී.එම්.එම්. බදුර්දීන් ප්‍රකාශ කලේ ''මෙම පාසල 1978 පටන් ම ප්‍රදේශයේ අධ්‍යාපන මධ්‍යස්ථානයක්ව පවතින බව ද වෛද්‍යවරු 23 දෙනෙක් ද, ඉංජිනේරුවන් 56ක් ද ඇතුලුව 300 වැඩි උපාධිධාරීන් පිරිසක් ද බිහිකර ඇත. පසු ගිය වර්ෂයේ විශ්ව විද්‍යාල ප්‍රවේශයෙන් ශිෂ්‍යයින් දෙදෙනෙක් වෛද්‍ය පීඨයට ද ඉංජිනේරු අංශයට එක් ශිෂ්‍යයෙක්ද තේරී සිටියහ. විද්‍යාලවලට ඇතුලුවූ මුලු සිසුන් සංඛ්‍යාව 30කි. මෙම පාසල මුලු කලාපයෙන් ම ඉහලම ප්‍රතිඵල පෙන්වා ඇත. එය විනාශයට පත් වීම ජනතාවට දරිය නොහැකි දෙයකි.''

මෙම පාසල තාවකාලිකව මස්ජුතුල් කබීර් පල්ලියේ පවත්වා ගෙන යයි. ටකරන් මඩු හතක් ද තනා ඇත. ''ගුරුවරුන්ගේ ද ආදි ශිෂ්‍යයින්ගේ හා දෙමව්පියන්ගේ කැප වීම නිසා ජනවාරි 25 වන දින පාසල නැවත ආරම්භ කිරීමට අපට හැකි විය. පාසැලේ තිබූ පරිඝනක 20 ම සුනාමියෙන් විනාශ විය. දැන් අපි ලඟ පරිඝනක කාමරයක් හෝ පුස්තකාලයක් නොමැත'' යනුවෙන් බදුර්දීන් වැඩි දුරටත් පැවසී ය. පාසල යලි ඉදිකිරීම සඳහා අලුත් ඉඩමක් සොයාගැනීම පාසැල් පරිපාලනයේ වගකීමක් බව අධ්‍යාපන අමාත්‍යංශය පවසයි. දැනට එක්සත් රාජධානියෙහි වෛද්‍යවරයෙකු ලෙස සේවය කරන පාසලේ ආදිශිෂ්‍යයෙකු පාසල යලි ඉදි කිරීම සඳහා ඉඩමක් මිලට ගෙන ඇත. මුහුදත් කලපුවත් අතර පිහිටා තිබෙන ප්‍රදේශයේ ජනගහන ඝනත්වය අධිකය. එමෙන් ම දුප්පත් ය. අම්පාරෙහි වෙනත් ප්‍රදේශ මෙන් නොව මෙහි වී ගොවිතැන සඳහා ඉඩම් සොයාගැනීම අසීරු ය. ජලය කෘෂිකර්මය සඳහා නුසුදුසු බැවින් ජනතාවගෙන් ගොවිතැනෙහි යෙදෙන්නේ සියයට විස්සක් පමනි. ජනගහනයෙන් සියයට විසි පහක් පමන ධීවර කර්මාන්තයේ ද තවත් සියයට විසි පහක් අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ ද නියැලී සිටියි. අනෙක් අය ගුරුවරු, ලිපිකරුවන්, වෛද්‍යවරු. ඉංජිනේරුවරු ආදී වසයෙන් රජයේ රැකියාවල නිරත වී සිටිති.

රාජ්‍ය අංශයේ රැකියා කරන වැඩිදෙනෙක් නිදහස් අධ්‍යාපනය නිසා සුදුසුකම් ලබා සිටිති. බදුර්දීන්ගේ එක් සහෝදරයෙක් වන පී.එස්. නසුර්දීන් ලෝක සමාජවාදී වෙබ් අඩවියට (ලෝසවෙඅ) ප්‍රකාශ කලේ: ''මගේ පියා ධීවරයෙක්. එහෙත් ඔහුගේ පුතුන් හත් දෙනා ගෙන් එක් අයෙක් වත් ධීවරයන් වූයේ නැත. සියල්ලන් ම විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා ඇත. අපගේ පවුලේ කලා උපාධිය සම්පූර්න කර ගත නොහැකි වූයේ මට පමන ය. මම 1998 දි කොලඹ විශ්වවිද්‍යාලයට ඇතුලු වුවත් එම අවධියේ රටේ පැවති නොසන්සුන්

තත්වය නිසා උපාධිය සම්පූර්න නොකර ම විශ්ව විද්‍යාලයෙන් සමු ගත්තෙමි. දැන් මම මරුදමුනේ මූලික රෝහලෙහි සාත්තු සේවකයෙකු ලෙස සේවය කරන්නෙමි.

''මගේ සහෝදරයින් නමදෙනාගෙන් එක් අයෙක් පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ දර්ශනවාදය පිලිබඳ කථිකාචාර්යවරයෙකි. ප්‍රදේශය තුල අපගේ පවුල විශේෂිත නො වේ. සෑම ගෙදරකම වාගේ උපාධිධාරින් එක් අයෙක් හෝ දෙදෙනෙක් සිටිති.'' යනුවෙනි.

''අපට පිලිතුරක් පවා ලබා ගත නොහැකි විය''

අපි තවත් මුස්ලිම් පාසලක් වන මල්හරුස් ශම්ස් මහා විද්‍යාලයට ගියෙමු. විදුහල්පති ඒ.ඒ. රසූල්ට අනුව පාසලේ ශිෂ්‍යයින් 1765 දෙනාගෙන් 98 දෙනෙක් ජීවිතක්ෂයට පත් වීය. දැන් ශිෂ්‍යයින් 1448 දෙනෙක් මූලික පහසුකම් පවා නොමැතිව ඉගෙනීමේ කටයුතුවල යෙදී සිටිති. පාසල් පුස්තකාලය, පරිඝනක හා විද්‍යාගාරය සුනාමියෙන් විනාශ විය. එය යථා තත්වයට පත් කිරීමට ආන්ඩුව මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැත. තාවකාලික රසායනාගාරයේ -- එය ඒ නමින් හැඳින්විය හැකි නම් -- ඇත්තේ පරීක්ෂන නල කිහිපයක් හා රසායන ද්‍රව්‍ය ස්වල්පයක් පමනකි. රසූල් තවදුරටත් පැවසුවේ ''අපට පාසල යලි විවෘත කිරීමට හැකි වූයේ පෙබරවාරි මාසයේ දී ය. වසර 1-5 දක්වා පන්ති සයින්දමරුදූ ජීඑම්එස්එස් පාසලේ දහවල් 1 සිට හවස 5 දක්වා පවත්වනු ලබයි. 6 වසරේ සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය දක්වා පන්ති අල් හලාල් විද්‍යාලයේ දී සවස්වරුවේ පවත්වනු ලැබේ. ජීඑම්එස්එස් පාසලේ පන්ති සාමාන්‍ය පරිදි පැවැත්වෙතත් අල් හලාල් පාසලේ අවශ්‍ය තරම් පන්ති කාමර නොමැති නිසා මාරුවෙන් මාරුවට පන්ති පවත්වනු ලැබේ. 6,7සහ 8 වසරවල පංති එක සතියක ද අනෙක් පන්ති අනෙක් සතිවල ද පවත්වනු ලබයි.

අපට අධ්‍යාපනය නිසියාකාරව පවත්වා ගෙන යා නොහැකි ය. එසේම දෙමව්පියන්, ආදිශිෂ්‍යයන් ගුරුවරුන් එක්වී පාසල කල්මුනේ මහ නගරසභාවට අයත් පොදු ක්‍රීඩාංගනයට ගෙන ආහ. මෙහි ගොඩනැගිලි සුන්බුන් ගොඩගැසී ඇත. ආන්ඩුවේ නොවන සංවිධානයකින් ඒවා ඉවත් කරමින් සිටියි. ටකරන් සෙවිලිකල තුනීලෑලි කාමර තුනක් තවත් සංවිධානයකින් ඉදි කර තිබේ. අප අඩක් නිම කර ඇති ක්‍රීඩාගාර ය ද යොදාගන්නා බව ඔබට ද පෙනෙනවා ඇත.

''එහෙත් තවමත් ඉඩකඩ ප්‍රමානවත් නැත. එබැවින් පාසැල දෙවරුවකට පවත්වනු ලබයි. 1 වසරේ සිට 5 වසර තෙක් සවස්වරුවේ ද අනෙක් පන්ති උදය වරුවේ ද වශයෙනි. පාසල් ගොඩනැගිලි ඉදිකර දීමට එක් හංගේරියානු ආයතනයක් ඉරිපත් වුව ද ආන්ඩුව ඉඩම නිල වශයෙන් පාසැලට පවරා නොදීම නිසා එය ද ඉවත්ව ගියේ ය. අප නාගරික කොමසාරිස්වරයා විමසූ විට ඔහු කියා සිටියේ තමාට අවශ්‍ය නීතිමය බලතල නොමැති බැවින් උතුරු නැගෙනහිර පලාත්සභාවේ ආන්ඩුකාරවරයාට දැන්විය යුතු බවයි. පාසල් සංවර්ධන සභාව ආන්ඩුකාරවරයාට දැන්වුවද අපට පිලිතුරක් පවා ලැබුනේ නැත.''

විශ්වවිද්‍යාල ප්‍රවේශ පන්තියේ සිසුවෙකු ප්‍රකාශ කලේ: ''සුනාමියෙන් අපේ පාසල විනාශවුනා. එය දැන් තාවකාලිකව පවත්වා ගෙන යන්නේ සයින්දමරුදූ පොදු ක්‍රීඩාංගනයේ ය. මීට පෙර අපට එක් විෂයක් සඳහා විනාඩි 45ක් වෙන් කර තිබුනත් දැන් එය විනාඩි 30කට සීමා වී ඇත. අපගේ පොත්පත් විනාශ වුනත් තවමත් අලුතෙන් පොත් කිසිවක් ලැබී නැත. මාස 6ක් ගතවී ඇතත් ආන්ඩුව කිසිවක් කලේ නැත.''

අපගේ පාර්ලිමේන්තු නියෝජිතයන් වන ජාතික සමගි පෙරමුනේ ෆේරියෙල් අෂ්රොෆ් හා අබ්දුල්ලා ද කිසිවක් නොකරයි. ඊට සපුරා වෙනස් ලෙස අපගේ ගුරුවරුන් ඉතා දුෂ්කර කොන්දේසි යටතේ පවා ප්‍රසංශනීය වැඩ කොටසක් ඉටු කරති. සමහර කොටසක් සිය ක්‍රීඩාපිටිය පාසැල සඳහා ලබාදීමට විරුද්ධ වෙති. ක්‍රීඩාපිටි නැවත සකස්කල හැකි ය. එහෙත් පාසල් අත්‍යාවශ්‍යය. ආන්ඩුව මෙම ස්ථානයෙහි ඉක්මනින්ම ගොඩනැගිලි ඉදිකල යුතු ය.

ඔහු සුනාමි ආධාර බෙදීම සඳහා කුමාරතුංග ආන්ඩුව හා දෙමල විමුක්ති කොටි සංවිධානය අතර ඇති කරගත් ඒකාබද්ධ යාන්ත්‍රනයට එරෙහිව ගෙන යන ස්වෝත්තමවාදී උද්ඝෝෂනය හෙලා දකියි. ''තමන්ට සිදු වූ අසාධාරනයට එරෙහිව දෙමල තරුනයන් ආයුධ අතට ගත් අතර 20 වසරක සිවිල් යුද්ධය රට විනාශ කලේ ය. දැන් ස්වෝත්තමවාදී භික්ෂූන් ඒකාබද්ධ යාන්ත්‍රනයට එරෙහිව සත්‍යග්‍රහ කරති. ඔවුන් යුද්ධයට යාමට සූදානම් ද? අපට යුද්ධය අවශ්‍ය නො වේ. ආන්ඩුව සියල්ලන්ටම සමාන පදනමකින් සැලකිය යුතු ය.''

පන්තියේ එක් ශිෂ්‍යාවක් මෙසේ පැවසුවා ය. ''මෙම තාවකාලික ස්ථානයේ ඇති නොයෙකුත් අවහිරතා නිසා අපට ඉගෙනුම කරගෙන යා නොහැක. නිතරම අධික ඝෝෂාවක් ඇත. පන්ති නිසියාකාරව බෙදා වෙන් කර නැත. අනෙක් පන්තියේ ගුරුවරයා කියන දේ නිතරම අපට ඇසෙයි. අපට ප්‍රමානවත් වැසිකිලි පහසුකම් ද නැත. ඇත්තේ තාවකාලික ජල ටැංකියකි. විද්‍යාගාරයක්, ගෘහ විද්‍යාගාරයක් හෝ කොම්පියුටර් පහසුකම් නැත. අපගේ අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාමට ස්ථිර ගොඩනැගිලි අවශ්‍ය ය.

අප අධ්‍යාපන කටයුතුවලට සිත යොමු කරන්නේ කෙසේ ද?

කරයිතිව්හි විපුලානන්ද මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍යයින් 27 දෙනෙක් සුනාමියට බිලිවිය. විනාශයට

පෙර සිටි ශිෂ්‍යයින් 1200ක් අතුරෙන් සිසුන් 1150ක් දැන් පාසලට පැමිනෙති. නියෝජ්‍ය විදුහල්පති නිල්ලෙයිම්බලම් අපට පැවසුවේ ''අපි යුනිසෙෆ් (එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල) මගින් ලබා දුන් කූඩාරම්වල ආධාරයෙන් ආර්එම්එම් බාලිකාවිද්‍යාලයේ තාවකාලිකව අධ්‍යාපන කටයුතු සඳහා පන්ති කාමර ඉදි කර ඇති අතර එහි ඉඩකඩ ප්‍රමානවත් නොවන බැවින් පාසල වරු දෙකකට බෙදා පවත්වා ගෙන යනු ලබන බව ය. 10 වැනි වසරේ සිට 13 වැනි වසර දක්වා පන්ති උදේ 8.00 සිට 12.30 දක්වා ද 6 වැනි වසරේ සිට 9 වසර දක්වා පන්ති දහවල් 1.00 සිට හවස 5.00 දක්වා ද පවත්වනු ලැබේ.

''පාසල් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් මිලියන 120ක මුදලක් ඉතාලි තානාපති කාර්යාලයෙන් ලැබී තිබෙන අතර අපි අක්කර 5ක ඉඩමක් ඒ සඳහා සොයා ගත යුතුව ඇත. එවන් ඉඩමක වෙලඳපොලේ මිල රුපියල් මිලියන 3.5ක්වේ. (ඇ.ඩො.35,000) නමුත් රජය අපට මෙම මුදල ලබා දීමට කැමති නැත. අපි රාජ්‍ය නොවන සංවිධාන ගනනාවකින් ආධාර ඉල්ලා සිටිය ද අපට කිසිවෙක් උදව් කලේ නැත. එම නිසා අපි තහනම් කරන ලද මීටර් 200 සීමාව යන්තම් ඉක්මවන මීට පෙර පාසල පිහිටි ස්ථානයේ ම ගොඩනැගිලි යලි ඉදිකිරීමට තීරනය කලෙමු. අපි එම ස්ථානයේ පාසල ඉදි කලත් ශිෂ්‍යයින්ගේ පැමිනීම අඩු විය හැකි අතර ගුරුවරුද ඒ සඳහා සතුටු වන්නේ නැත. නමුත් අපට වෙනත් විකල්පයක් නොමැත.''

සුනාමියෙන් නිවාස සහ සියලු දේපොල අහිමි වූ ගුරුවරු 13 දෙනෙකු මුහුන පා සිටින ප්‍රශ්න පිලිබඳව ද ඔහු විස්තර කලේ ය. ආන්ඩුව ඔවුන්ගේ වසරක වැටුප පොලී රහිත නයක් ලෙස ලබා දීමට පොරොන්දු වී ඇත. එහෙත් තවමත් ඒවා ලැබී නැත. මොවුන් තමන්ගේ මාසික වැටුපෙන් පමනක් ගෙවල් සාදාගන්නේ කෙසේ ද? ඔවුන් තම නෑදෑ ගෙවල්වල තාවකාලිකව නැවතී සිටින අතර මෙම භාරදූර අවස්ථාවේ ඔවුනට හරියාකාරව ඉගැන්වීම් කටයුතු සිදු කල හැකි ද?

7 වසර ඉගෙනගන්නා ශිෂ්‍යාවක් පැවසූ අන්දමට ''හවස් කාලයේ පාසලේ ඉගෙනගැනීම ඉතාම දුෂ්කරයි. පාසල හවස 5.00ට වසා දමන බැවින් ගෙවල්වලට යාමට රෑබෝවෙයි. අපි මෙම ප්‍රශ්න මැද කෙසේ නම් අධ්‍යාපනය පිලිබඳ සිත යොමු කරන්න ද? අපට ජලය නිසියාකාරව නොලැබෙන අතර වැසිකිලි පහසුකම්ද නොමැත. වැඩි ශිෂ්‍ය පිරිසක් මේස පුටු හිඟයට ද මුහුන පා සිටිති. විද්‍යාගාරය පරිඝනක අංශය හා පුස්තකාලය විනාශයට පත් වී ඇත. රජය මේ දක්වා ඒවා නැවත සාදා දුන්නේ නැත.

අක්කරයිපත්තු අල් බදූර් විද්‍යාලය බදූර් නගර පල්ලියේ දානට තාවකාලිකව පවත්වාගෙන යනු ලැබේ. යුනිසෙෆ් ආධාරයෙන් කූඩාරම් සහ පොත්පත් ලැබී තිබේ. එම පාසල ඉතාම අසීරු කොන්දේසි යටතේ පවත්වා ගෙන යයි. අපි එම ස්ථානයට යන විට තාවකාලික ජල ටැංකිය හිස්ව තුබූ අතර දවස් තුනක් තමන්ට පානය කිරීම සඳහා ජලය නොමැතිව අසීරුතාවට මුහුන දුන් බව ගුරුවරු පැවසූහ. පල්ලියේ සංවිධායක කමිටුව මාසයක් ඇතුලත එම ස්ථානයෙන් ඉවත්වන ලෙස දන්වා ඇත. එහෙත් යාමට ස්ථානයක් නොමැති බව ගුරුවරු පැවසූහ. මීටර් 100 සීමාව තුල තිබූ පාසල සුනාමියෙන් සම්පූර්නයෙන් ම විනාශයට පත් වී ඇත.

ශිෂ්‍යයින් 108 දෙනාගේ ඉදිරි අනාගතය අඳුරු ය. එක් ගුරුවරයෙකු පැවසුවේ ''අපට ගොඩනැගිලි සඳහා රු. මිලියන 40ක මුදලක්ද ඉඩම් සඳහා රු. මිලියන 2.8ක මුදලක්ද අවශ්‍ය වේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් නිලධාරියෙකු, රජයට මේ සඳහා මුදල් නොමැති බවත් සුදුසු ආකාරයේ ඉඩමක් සොයාගැනීම ගුරුවරු, දෙමව්පියන් සහ ආදිශිෂ්‍යයන්ගේ වගකීම බවත් එවිට ගොඩනැගිලි සඳහා අරමුදල් සැපයීමට රාජ්‍ය නොවන සංවිධානයක් මෙහෙයවා ගත හැකි බවත් බවසා ඇත. ''අප පොහොසතුන් නො වේ. එබැවින් අවශ්‍ය මුදල් කෙසේ සොයාගන්න ද''

© www.wsws.org